# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2020 ඔක්තෝම්බර්


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල් අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2020 ඔක්තෝම්බර් මාසයේ ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය (Headline Inflation) 5.5%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. පසුගිය සැප්තැම්බර් මාසයේ මතුපිට උද්ධමනය 6.4%ක් ලෙස වාර්තා විය. 2020 ඔක්තෝම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 4.6%ක හා ආහාර නොවන කාණ්ඩයේ 0.8%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2019 ඔක්තෝම්බර් මාසයේ 5.6% ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 3.2%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2.4%ක් විය. 2019 ඔක්තෝම්බර් මාසයට සාපේක්ෂව 2020 ඔක්තෝම්බර් මාසයේ ආහාර කාණ්ඩයේ ප්‍රතිශතය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොල්, සහල්, කහ කුඩු, පොල්තෙල් සහ සීනි යන ආහාර ද්‍රව්‍යවල පැවති ඉහළ මිල මට්ටම් ය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2020 සැප්තැම්බර් මාසයේ 138.9ක් වූ දර්ශකාංකය 2020 ඔක්තෝම්බර් මාසයේ 139.1ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2020 ඔක්තෝම්බර් මාසයේ දර්ශකාංකය 0.2ක වැඩිවීමක් එනම් 0.1ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.14%කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.02%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට ලොකු ළූණු, සහල්, රතුළූණු, පොල්, මයිසූර් පරිප්පු, අමු මිරිස්, වියළි මිරිස්, අර්තාපල්, කහ කුඩු සහ සුදුළූණු යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් පළතුරු, අළුත් මාළු, බිත්තර, එළවළු, කුකුල් මස් සහ සීනි යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා විය.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2020 ඔක්තෝම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (ගොඩනැගිලි ද්‍රව්‍ය), 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' සහ 'විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම බලපා ඇත. එහෙත් 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (පුවක්) යන කාණ්ඩයේ මිල අඩුවීමක් වාර්තා වී ඇත. තවද පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'රෙදිපිළි හා පාවහන්', 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩවල සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. එසේම, පසුගිය මාසය හා සංසන්දනය කළවිට 'සෞඛ්‍ය', 'ප්‍රවාහන', 'සන්නිවේදන' සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවල මිල දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යාමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2020 සැප්තැම්බර් මාසයේ 4.8% සිට 2020 ඔක්තෝම්බර් මාසයේ 4.5% දක්වා අඩුවීමක් වාර්තා විය.

**ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම: 2013=100), ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි), ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සහ ලක්ෂ්‍යමය යටිදැරි උද්ධමනයේ විචලනය**




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) |
| **2019** | ඔක්. | 131.9 | 134.4 | 1.0 | 0.3 | 5.6 | 5.6 |
| | නොවැ. | 132.9 | 134.6 | 0.8 | 0.1 | 4.1 | 5.5 |
| | දෙසැ. | 135.0 | 134.2 | 1.6 | -0.3 | 6.2 | 5.2 |
| **2020** | ජන. | 137.0 | 135.3 | 1.5 | 0.8 | 7.6 | 3.9 |
| | පෙබ. | 137.0 | 135.8 | 0.0 | 0.4 | 8.1 | 3.4 |
| | මාර්තු | 135.2 | 136.0 | -1.3 | 0.1 | 7.0 | 3.2 |
| | අප්‍රේල් | 134.8 | 136.9 | -0.3 | 0.7 | 5.9 | 3.2 |
| | මැයි | 135.4 | 137.9 | 0.4 | 0.7 | 5.2 | 3.7 |
| | ජූනි | 137.3 | 138.9 | 1.4 | 0.7 | 6.3 | 4.4 |
| | ජූලි | 137.3 | 139.4 | 0.0 | 0.4 | 6.1 | 4.5 |
| | අගෝ. | 137.8 | 139.9 | 0.4 | 0.4 | 6.2 | 4.6 |
| | සැප්. | 138.9 | 140.4 | 0.8 | 0.4 | 6.4 | 4.8 |
| | ඔක්. | 139.1 | 140.5 | 0.1 | 0.1 | 5.5 | 4.5 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව